# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ)
## (සංශෝධන)

**1944 අංක 54 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින්
2022 අගෝස්තු මස 31 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 අගෝස්තු මස 22 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[148 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

## 1944 අංක 54 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

1991 අංක 14 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීම) (සංශෝධන) පනතින් සංශෝධිත 1944 අංක 54 දරන ලංකා බැප්ටිස්ට් සභා ආඥාපනත යටතේ සංස්ථාගත කරන ලද, මින් පෙර ලංකා බැප්ටිස්ට් සභාව යන නමින් හඳුන්වන ලද ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමයෙහි සාමාජිකයන් විසින් එකී සංගමයෙහි නාමය සංශෝධනය කිරීම සඳහා යෝජනාවක් සම්මත කරගෙන ඇති හෙයින් ද:

එකී යෝජනා සම්මතය බලාත්මක කිරීම සඳහා එකී සංගමය විසින් එම සංගමයේ නාමය වෙනස් කිරීම සඳහා ඉල්ලුම්කර ඇති හෙයින් සහ එම ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදීම උචිත වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක    දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1991 අංක 14 දරන පනතට සිදුකරනු ලබන පොදු සංශෝධන

**2.** 1991 අංක 14 දරන ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (සංස්ථාගත කිරීම) (සංශෝධන) පනතේ හෝ එම පනත යටතේ නිකුත් කර ඇති ඕනෑම නිවේදනයක හෝ වෙනත් ලේඛණයක ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය (එකී නාමයෙන්ම හෝ "සංගමය" යන කෙටි යෙදුමින්) සඳහන් වන සෑම සන්දර්භයකම, එකී සන්දර්භය මගින් අන්‍ය ආකාරයකින් නියම කරනු නොලබන්නෙහි නම්," ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය" හෝ "සංගමය" යන යෙදුම "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව"හෝ "සභාව"යන යෙදුම මගින් අවස්ථාවෝචිත පරිදි ආදේශ කරනු ලැබේ.

ගිවිසුම් ආදිය සම්බන්ධයෙන් ආරක්ෂා සැලසීම

**3.** මෙම පනත බලපැවැත්වීම ආරම්භ වන දිනයට පෙර "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය" විසින් හෝ ඒ වෙනුවෙන් ඇතිකරන ලද, නිකුත් කරන ලද හෝ ක්‍රියාත්මක කරන ලද සෑම කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක් හෝ වෙනයම් මෙවලමක් හෝ ලේඛනයක්ම මෙම පනත බලපැවැත්වීම ආරම්භ වූ දිනයේ සිට සහ ඉන් පසුව "ශ්‍රී ලංකා බැප්ටිස්ට් සභාව" විසින් ඇති කරන ලද, නිකුත් කරන ලද හෝ ක්‍රියාත්මක කරන ලද ඒවා ලෙස සලකනු ලැබේ.

**4.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව